**යටියන්තොට ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිගණක මිළ දී ගැනීමක් සඳහා ගිවිසුම්ගතව නොතිබිය දී රු.900,000ක වෙන් කිරීමක් ගිණුම්වල සිදුකර තිබුණි. | 2023 වර්ෂයේ නිරවුල් කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ආදායම් වියදම් ගිණුමට මාරු කළ යුතු රු.1,583,588ක් වූ සමාලෝචිත වර්ෂයේ පොහොර නිෂ්පාදන ඌනතාව සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | එකතුව රු.55,119,772ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 15ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීක කරන බව. | - එම - |
| (ඈ) | කට්ටිකර විකිණීම නිම කළ ඉඩමකින් ලද රු.784,000ක් තැන්පත් ගිණුමෙන් ඉවත්කර ආදායමට බැරකර නොතිබුණි. එමෙන්ම, එම සත්‍ය විකුණුම්වලින් අයවිය යුතු රු.100,990ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | එම වටිනාකම් ඉදිරියේදී ලබා ගැනීමට නියමිත බව. | - එම - |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 ක් ඉක්ම වූ රු.98,600ක ටෙන්ඩර් ඇප තැන්පතු නියාදනය කර නොතිබුණි. | සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,784,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,989,012 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් 2ක පැවති රු.13,723,816ක ශේෂය කෙටිකාලීන ආයෝජනයක හෝ යොදවා ආදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි. | කෙටිකාලීන ආයෝජන යෙදවීමට සොයා බලා කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගත යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,306,642 | 4,475,968 | 4,262,495 | 1,204,536 | 4,774,648 | 4,472,797 | 4,572,798 | 975,863 |
| (ii) | කුලී | 8,479,900 | 7,874,817 | 8,417,067 | 153,951 | 8,800,960 | 5,611,520 | 4,809,011 | 606,638 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 850,050 | 957,409 | 967,009 | - | 725,050 | 931,452 | 118,900 | 9,600 |
| (iv) | වෙනත් ආදායම් | 5,139,700 | 8,413,354 | 7,458,054 | 1,204,735 | 4,404,500 | 2,176,642 | 2,033,024 | 354,198 |
| | | 18,776,292 | 21,721,548 | 21,104,625 | 2,563,222 | 18,705,158 | 13,192,41 | 11,533,733 | 1,946,299 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 - 2010 වර්ෂ අතර කාලය තුළ කට්ටි කළ ඉඩම් 08ක සත්‍ය විකුණුම් මත ලැබිය යුතු මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (1) වගන්තිය පරිදි අයකර නොතිබුණි. | විගණන මඟ පෙන්වීම සැලකිල්ලට ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වරිපනම්, අක්කර බදු, හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,358,488ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.640,898ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.22,060ක ශේෂයක් ද පැවැතිණි. | හිඟ මුදල් නොපමාව අය කිරීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් නොපමාව අය කර ගත යුතු වේ. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලාන) රීති අංක 59 හා 67 අනුව 2021 හා 2022 වර්ෂවල දී ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු වෙනුවෙන් සමීක්ෂණයක සිදුකර නොමැති නිසා රු.860,326 ක් වූ එකතු කළ ආදායම වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි. | ඉදිරි වර්ෂය තුළ සමීක්ෂණයක් සිදු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු සමීක්ෂණය කර බිල් කිරීම වෙනුවට වර්ෂය තුළ එකතු කළ රු.97,075ක් වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි. | 2021 වර්ෂයේ දී සිදු කළ සමීක්ෂණය අනුව ලැබිය යුතු ආදායම් නිශ්චය කර ඇත. සංශෝධන ද කාලීනව සිදු කරන බැවින් 2022 වර්ෂයේදී ලද ආදායම එම වර්ෂයේ ඇස්තමේන්තුව ලෙස සැලකීම සාධාරණ බව. | සමීක්ෂණ සිදුකර දැන්වීම් පුවරු ආදායම් නිවැරදිව හඳුනා ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | -------------- |
| (අ) | වසර 01ත් වසර 04ත් අතර පැරණි රු.6,820,484ක ශේෂ ණයහිමි ශේෂය තුළ පැවැතිණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (ආ) | පරිත්‍යාග ලෙස 2019 වර්ෂයේ ලද මාර්ග පිරිසිදු කිරීමේ යන්ත්‍රයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | එම යන්ත්‍රය සභාවේ අවශ්‍යතා හා නොගැළපේ. යන්ත්‍රයේ ආරක්ෂාවට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කළ බව. | සභාවේ අවශ්‍යතාවයට නොගැළපේ නම් සුදුසු පරිදි අපහරණය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කිතුල්ගල ප්‍රදේශයේ 2021 වර්ෂයේ දී ඉදිකළ රු.1,950,822ක් වූ වෙළඳ කුටි 14ක් 2022 ඔක්තෝබර් වනවිටත් අභාවිතව පැවතුණි. | වෙළඳ කුටි 11ක බදු දීමේ කටයුතු අවසන් කර ඇති බවත්, ඉතිරි වෙළඳ කුටි 3 බදු දීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ආ) | යටියන්තොට හා කිතුල්ගල මාළු වෙළඳසැල් 03ක් බදු දීමේ දී අවශ්‍ය තක්සේරුව, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව රජයේ තක්සේරුකරු මගින් ලබා ගෙන නොතිබුණි. එමෙන්ම, කිතුල්ගල මාළු වෙළඳසැල 2015 වර්ෂයේ සිට සිට 2021 වර්ෂය දක්වා අඛණ්ඩව එකම ලංසුකරුවකු වෙත බදු දී තිබුණි. | මේ පිළිබඳ ලබාදුන් මඟ පෙන්වීම අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ලද උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ පුරප්පාඩු 27 ක් පැවැති අතර, ඉන් තනතුරු 10ක් සඳහා සේවා ගිවිසුම් මත බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා පත්වීම් බලධරයා දැනුවත් කර ඇති බව. | අවශ්‍යතාව මත පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. |
| (ආ) | සභාවේ සේවකයින් 33 දෙනෙකුගෙන් 1985 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව රු.169,423ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ හිටි මුදල නිරවුල්කර ගැනීමට කටයුතු අරඹා ඇති බව. | හිඟ ණය නොපමාව අයකර ගත යුතු වේ. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු දේපළ 02ක් 2020 - 2022 වර්ෂ අතර කාලය තුළ බදු දී නොතිබීම නිසා එහි අවම ලංසු වටිනාකම වූ රු.302,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ලබාදුන් මග පෙන්වීම අනුව කටයුතු කරන බව. | බදු දිය හැකි වත්කම්වලින් ආදායම් උපයා ගත යුතුය. |
| (ආ) | රු.16,455,000ක් වූ වාහන 09ක සහ රු.3,200,000 ක් වූ බොබ්කැට් යන්ත්‍රයක අයිතිය පවරා ගෙන නොතිබුණි. | අබලි වාහන 9න් 02ක් අපහරණය කිරීමටත් ඉතිරි වාහන පවරා ගැනීමටත් කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | රු.11,302,500 ක් වූ වාහන 07 ක්, බැකෝ යන්ත්‍රයක් හා ජල බවුසරයක් වසර 01 සිට වසර 13 දක්වා කාලයක සිට අක්‍රීයව පවතී. | අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ඇ) | සභාව සතු ඉඩම් 18 ක් 2017 අගෝස්තු 16 දිනැති අංක 04/2017 දරන සබරගමුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස කමිටුවක් මගින් කළ රු.69,636,100ක තක්සේරුවක් මත ගිණුම්ගත කර තිබුණි. | රජයේ තක්සේරුව ලබාගෙන 2023 වර්ෂයේදී මෙම ගැටලුව නිරාකරණය කරගන්නා බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |